**හපුතලේ නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 02 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

**1.2 මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
---------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,553,147 ක් වූ හිඟ වරිපනම් බදු රු.2,464,036 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂය අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂය රු.89,111 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු තානායම් කළමනාකරණ ගාස්තු ආදායම රු.4,078,242 ක් වුවද, එය රු.3,471,258 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම් රු.606,984 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු මුදල රු.319,307 ක් වුවද, ණයහිමියන් යටතේ රු.3,004 ක් පමණක් ප්‍රතිපාදන සැලසීම නිසා බැරකම් රු.316,303 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) රු.83,065 ක් වූ ප්‍රතිපූර්ණ සංචිත ගිණුමේ වූ ශේෂය ආයෝජනය කර නොතිබුණු අතර, එම සංචිතය නියෝජනය වන වත්කම් හඳුනාගත නොහැකි විය.

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.15,305,408 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.30,835,785 ක් විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**
----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,222,207 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 164 වගන්තිය | ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් අනුමත නවාතැන් පලවලින් ඉකුත් වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 ක් නොඉක්මවන මුදලක් අදාල වර්ෂයේ බලපත්‍ර ගාස්තු ලෙස අයකළ යුතු වුවද, සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන එවැනි නවාතැන්පල 02 කින් එසේ ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.371 අවස්ථා 15 කදී විවිධ පාර්ශවයන් වෙත | සභාව විසින් 1997 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාකාලය තුල ගෙවන ලද රු.348,042 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය හා මියගිය සේවකයින් 29 දෙනෙකු ගෙන් වසර 02 සිට 17 ක කාලයක සිට අය නොවී පවතින රු.176,816 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,913,515 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,154,215 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,759,300 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,755,787 | 1,775,997 | (20,210) |
| බදු කුලී | 6,952,042 | 7,283,384 | (331,342) |
| බලපත්‍ර ගාස්තු | 387,850 | 384,650 | 3,200 |
| සේවා සඳහා ගාස්තු | 10,333,564 | 1,876,394 | 8,457,170 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 174,745 | 131,925 | 42,820 |
| වෙනත් ආදායම් | 426,057 | 291,560 | 134,497 |

| | | | | |
|---|---|---|---|---|
| ආදායම් ආධාර | 14,543,625 | 13,664,533 | 879,092 | |
| | | | ------------- | 9,165,227 |
| පුනරාවර්තන වියදම<br>--------------------- | | | | |
| වැටුප් හා දීමනා | 16,855,207 | 16,312,262 | (542,945) | |
| ගමන් වියදම් | 317,441 | 241,267 | (76,174) | |
| සැපයුම් හා උපකරණ | 1,431,700 | 944,592 | (487,108) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු කිරීම් | 1,402,071 | 913,468 | (488,603) | |
| ප්‍රවාහන සම්බන්ධතා හා උපයෝගී සේවා | 1,604,710 | 1,025,246 | (579,464) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 2,116,332 | - | (2,116,332) | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 752,698 | 538,139 | (214,559) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 179,996 | 279,254 | 99,258 | |
| | | | ----------- | (4,405,927) |
| | | | | ------------- |
| | වාසිදායක විචලනය | | | 4,759,300 |
| | | | | ========= |

2.3 **ආදායම් පරිපාලනය**
---------------------

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
------------------------------------

2013 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායමෙන් හා 2013 වර්ෂයේ බිල්කළ ආදායමෙන් අයකිරීම්වල ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

2.3.2 **වරිපනම් බදු**
--------------

වරිපනම් බදු අයවිය යුතු දේපල සම්බන්ධයෙන් 2006 වර්ෂයේ දී සිදුකළ තක්සේරුවෙන් පසු සභා බල ප්‍රදේශය තුල ඉදිකිරීම් පිළිබඳව සමීක්ෂණයක් කොට වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 **බදු කුලී**
--------

සභාව සතු මස් හා මාළු කඩ 2001 සිට 2012 වර්ෂය අතර කාලය තුලදී බදුගත් බදුකරුවන්ගෙන් අයවිය යුතුව පවතින රු.647,459 ක හිඟ බදු කුලී සහ 2013 වර්ෂය සඳහා බදුගත් බදුකරුවන්ගෙන් අයවිය යුතු රු.419,629 ක බදු කුලී අයකර ගෙන නොතිබුණි.

2.3.4 **තානායම් කළමනාකරණ ගාස්තු**
----------------------------------

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පාලනය කළ තානායමෙන් 1999 සිට 2007 දක්වා කාලයට අදාලව අයවිය යුතු රු.3,974,194 ක තානායම් කුලී සහ තානායම් කළමනාකරු විසින් ගෙවීම් පැහැර හැරීම මත සභාව විසින් පියවන ලද රු.74,824 ක විදුලි ගාස්තු සභාව වෙත අයකරගෙන නොතිබුණි.

2.3.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 154,083 |
| මුද්දර ගාස්තු | 370,129 |

2.3.6 කඩකාමර බදු

-----------------

(අ) සභාව සතු කඩ කාමර සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මාසික කුලී තක්සේරුකර නොගෙන සභාව තීරණය කළ, වෙළඳපල වටිනාකමට නොගැලපෙන අඩු බදු කුලී මුදලක් අයකරමින් පැවතුනි.

(ආ) කඩ කාමරයක් බදුගත් බදුකරු සිය කැමැත්තෙන්ම බදු ගිවිසුම අවලංගු කරගන්නා අවස්ථාවක කඩ කාමරය සභාව වෙත පවරාගෙන නැවත ටෙන්ඩර් කැඳවා බදුදීමට කටයුතු කළ යුතු වුවද, සභාව විසින් අවස්ථා 09 කදී නැවත ටෙන්ඩර් කැඳවීමකින් තොරව නම් මාරුකිරීමේ ගාස්තුවක් පමණක් අයකරගෙන බදු අයිතිය ලබාදී තිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර 22 කින් යුත් බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමරය පමණක් බදු දී ඇති අතර, කඩ කාමර කිහිපයක අවම ලංසු මුදල සහ මාසික බදු කුලී මුදල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබූ මුදලට වඩා අවම ලංසු මුදල 12% සිට 104% දක්වා පරාසයක් තුල සැලකිය යුතු වටිනාකමකින් වැඩිකර තිබුණි.

(ඈ) කඩ කාමර බදු ගැනීම සඳහා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීමට අවම ලංසු මුදල විශාල අගයකින් ඉහල යාම හේතුවී තිබුණි. බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබූ රු.24,089.846 ක ණය මුදලට අදාලව පොලී වශයෙන් පමණක් රු.14,404,482 ක් ගෙවිය තිබුණෙන් ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතීම මත සභා අරමුදලේ මූල්‍ය තත්ත්වයට අහිතකර ලෙස බලපා තිබුණි.

2.3.7 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

--------------------------

ශ්‍රී ලංකා ජනරජයේ 2012 ඔක්තෝබර් මස 12 දිනැති අංක 1780 දරන ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පලකර ඇති උපලේඛන ප්‍රකාර සභා බල ප්‍රදේශය තුල සවි කරන ලද ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රුපියල් සියයක් (රු.100) බැගින් වූ වාර්ෂික ගාස්තුවක් අයකළ යුතු වුවද, සභා බල ප්‍රදේශය තුල සවිකර ඇති ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු 11 ක් සඳහා වාර්ෂික ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු ලෙස 2013 වර්ෂය වෙනුවෙන් රු.271,200 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

(අ) සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2013 වර්ෂය වන විට සභා බල ප්‍රදේශයේ ස්ථාන 04 ක සන්නිවේදන කුළුණු ඉදිකර තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල පවත්වා ගෙන යන ඉන්ධන පිරවුම්හල සඳහා පරිසර බලපත්‍රයක් නිකුත් කර නොතිබුණු අතර, 2013 වර්ෂය වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු හෝටල් / ආගන්තුක නිවාස 17 ක්, ඇඹරුම්හලක් හා තේ කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 **නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

සභාව සතු සාමාන්‍ය තක්සේරුව රු.300,000 ක් පමණ වූ රුමේනියන් වර්ගයේ මාර්ග තලනයක් 2007 වර්ෂයේ සිටම සභා භූමිය තුල නිශ්කාර්යව රඳවා තිබුණි.

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

නිමි වැඩ වටිනාකම රු.792,389 ක් වූ ආතර් සිරිසේන මාවතේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ 10% අතරුදවුම් මුදල 2013 ඔක්තෝබර් 09 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද, එම මාර්ගයේ කොන්ක්‍රීට් තලයේ වර්ග අඩි 30 ක පමණ ප්‍රමාණයක් පලුදු වී තිබුණි. අත රුදවුම් ගෙවීමට පෙර අදාල කොටස කොන්ත්‍රාත්කරු ලවා පිළිසකර කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත පරිදි විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| කුලී | 13,647,731 | 6,952,042 | 6,695,689 | 49 |
| බලපත්‍ර ගාස්තු | 352,200 | 387,850 | 35,650 | 10 |
| සේවා සඳහා ගාස්තු | 2,174,999 | 10,333,564 | 8,158,565 | 375 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 121,302 | 174,745 | 53,443 | 44 |
| වෙනත් ආදායම් | 140,000 | 426,057 | 286,057 | 204 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| සැපයුම් හා උපකරණ | 1,040,500 | 1,431,700 | 391,200 | 37 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු කිරීම් | 1,626,000 | 1,402,071 | 223,929 | 14 |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක සේවා හා වෙනත් සේවා | 1,257,000 | 1,604,710 | 347,710 | 28 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 4,029,000 | 2,116,332 | 1,912,668 | 47 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 1,207,400 | 752,698 | 454,702 | 38 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 405,600 | 179,996 | 225,604 | 56 |

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ගබඩා පාලනය